Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා

## මගෙන් වචනයක්..

උසස් පෙළට ඔයා මීඩියා තෝරගන්න හේතු සැහෙන්න ඇති.ආසම සබ්ජෙක්ට් එක නිසා,ඉසෙඩ් එක වැඩි,ලේසි නිසා,යාලුවා කරන නිසා,එයා කරන නිසා,ගෙදරින් කිව්ව නිසා ඔය වගෙ හේතු ඇති.

ඒ මොන හේතුව තිබුනත් පොඩ්ඩො ඔයා විභාගෙට හොද ලකුණක් දාන්නම ඔනි.ඔයාට මොන හේතුවක් තිබ්බත් ඔයාගෙ දෙමව්පියන්ට තියෙන්නෙ එක හේතුවයි.ඒ මගෙ දුව මගෙ පුතා හොද තැනකට ඒවි කියන බලාපොරොත්තුව විතරයි.ඒ බලාපොරොත්තුවත් හේතුවත් ඉශ්ඨ කරගෙන ඔයාගෙ හීනත් ඉශ්ඨ කරගෙන ඔයා විභාගේ ඉහලින්ම සමත් වෙන්න ඔනි.

ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙපා.සහභාගි වෙලා ෆේල් ලකුනක් අරන් වැඩක් නැ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!



Design by - Creativepixel.lk - Search us on fb/insta

තුන්වෙනි පාඩම

# මූලික සන්නිවේදන වර්ග, ස්වරූප හා ආකෘති

Basic Communication types,forms and formats

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023
මීඩියා
COMMUNICATION & MEDIA STUDIES
මොළේටම නිතටම මීඩියා
විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

# සන්නිවේදන වර්ග ස්වරූප හා ආකෘති

## සන්නිවේදන වර්ග

01. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
02. අන්තර්පුද්ගල සන්නිවේදනය
03. සමූහ සන්නිවේදනය
04. මහජන සන්නිවේදනය
05. ජන සන්නිවේදනය
06. අනන්‍ය සන්නිවේදනය

### 01. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය

**තමන් තමා සමග සිදු කරනු ලබන සන්නිවේදනය අන්තර්-වර්ති පුද්ගල සන්නිවේදනයයි.**තම මනස අභ්‍යන්තරයේ සිදුවන සන්නිවේදනයකි.
නිදසුන් ලෙස කල්පනා කිරීම, යාඥා කිරීම,
භාවනා කිරීම, පාඩම් කිරීම, යමක් මෙනෙහි කිරීම දැක්විය හැකිය.

උදා:
■ සුනිල් උදෑසන අවදිවී එදිනට සිදු කිරීමට නියමිත වැඩකටයුතු පිළිබඳව මෙනෙහි කිරීම.

■ මහාචාර්යවරයක් පසුදිනයේ ඉදිරිපත් කළ යුතු දේශ-යට අදාල කරුණු මතක්කර ගැනීම.

■ පාසලේ සාහිත්‍ය සමිතියට ගයනා කිරීමට ඇති ගීතය සජීනා කට පාඩම් කරගැනීම.

### අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන

පෞරුෂ වර්ධනයට
ස්ව සංකල්ප පෝෂණයට
චින්තනය ගොඩ නගා ගැනීමට
මතක තබා ගැනීමට
තීරණ ගැනීමට
විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට
නිර්මාණශීලීත්වය ඔප් නංවා ගැනීමට

### 02. අන්තර්පුද්ගල සන්නිවේදනය

**පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු අතර සන්දේශ හුවමාරු කරගැනීමයි.**පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර සිදුවන තොරතුරු හුවමාරුවයි.

**මෙහි ආකාර දෙකකි**
■ **මුහුණට මුහුණලා** සිදු කෙරෙන පුද්ගලාන්තර සන්නි-වේදනයි.
උදා: පුද්ගලයන් දෙනෙනෙකු කථා කිරීම.

■ **යන්ත්‍ර සහායක** පුද්ගලාන්තර සන්නිවේදනයි.
උදා: පුද්ගලයන් දෙදෙනෙකු දුරකථනය ඔස්සේ කථා කිරීම.

**අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන**

■ වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව
■ අනෙකුත් සන්නිවේදන වර්ගවලට සංජේක්ෂව පෙළඹවීමේ හැකියාව වැඩිය
■ අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හැකිවීම්
■ පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කර ගත හැකිවීම
■ වඩා තීව්‍ර සහවේදනයකට අවකාශ සැලසීම

## 03. සමූහ සන්නිවේදනය

**කිසියම් පිරිසක් හෙවත් සමූහයක් පොදු අරමුණක් ඇති එකට එක්ව** සිදු කරන සන්නිවේදනයයි සමූහය යනු කුඩා පිරිසකි.

උදා:
■ කාර්යාලයක මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීමක්
■ ධර්ම දේශනාවක්
■ වෘත්තිය පුහුණු සැසියක්
■ මිතුරු හමුවක්
■ ප්‍රිය සම්භාෂණයක්
■ විභාග සම්මන්ත්‍රණයක්

සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමේ විධික්‍රම


■ පෙර සූදානම
■ අරමුණු සහිත බව
■ ආචාචික සන්නිවේදන විධික්‍රම භාවිතය
■ විවිධ තාක්ෂණික උපකරණ මෙවලම් භාවිතය
■ ප්‍රදීපාගාර උපක්‍රමය
■ ආරක්ෂණීය කථා විලාසය
■ ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය
■ ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳව සැලකිලිමත්වීම
■ කාල කළමනාකරණය
■ ආචාරශීලීභාවය
■ වගකීම හා වගවීම

**සමූහ සන්නිවේදනයේ ප්‍රයෝජන**

■ සමාජීය පොදු කාර්යයන් වලදී ඉවහල්වීම
■ විවිධ මති මතාන්තර අදහස් හා යෝජනා දැන ගැනීමට හැකිවීම
■ පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීම
■ සහභාගී වන පිරිසගෙන් ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණය ලබා ගැනීමට හැකිවීම
■ දැනුම සම්පත් ආදිය බෙදාහදා ගැනීමේ හැකියාව

## 04 ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය

විල්බර් ශ්‍රාම් ( ක්‍රිව 1907 * 1987 ) සහ චාර්ල්ස් ඔස්ගුඩ් විසින් මෙම ආකෘතිය 1954 දී හඳුන්වා දී තිබේ. සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් මෙම ආකෘතිය ඉදිරිපත් කර තිබේ.




සන්නිවේදන ක්‍රියාවලිය එක් තැනැකින් ආරම්භ වී තවත් තැනැකින් අවසන් නොවී චක්‍රීයව ගමන් කරන බව මෙම ආකෘතියෙන් පැහැදිළි කරයි.


**මෙම ආකෘතියේ විශේෂතා**

රේඛීය නොවන චක්‍රිය සන්නිවේදන ආකෘතියකි.
සන්නිවේදකයා මෙන්ම ග්‍රාහකයා ද සන්නිවේදනයට වැදගත් වන බව පෙන්වා දී තිබේ.
ආකේතකරණය විකේතකරණය අර්ථකථනය යන අවස්ථා පැහැදිළි කර ඇත.
සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පෙන්වා දී තිබේ.
ප්‍රතිපෝෂණය යන්න ඇතුළත් කර ඇත.

ලහිරු කේ. මදුශාන්
LAHIRU K - MEDIA STU
search us on youtube,fb,Tiktok

## 02 හැරල්ඩ් ඩී ලැස්වේල් ආකෘතිය

**ඇමෙරිකානු ජාතික දේශපාලන විද්‍යා මහාචාර්යවරයෙකු වූ හැරල්ඩ් ඩී ලැස්වේල්** (ක්‍රිව 1902 *1978) විසින් 1948 දී ඉදිරිපත් කරන ලද අදහස් ඇසුරින් ගොඩනගන ලද ආකෘතියකි.





**කවුද?** සන්නිවේදකයා
**කුමක් කියයිද?** සන්දේශය
**කුමණ නාලියකින්ද?** නාලිකාව හෙවත් මාධ්‍ය
**කාහටද ?** ග්‍රාහකයා
**කුමන බලපෑමක් සඳහා ද?** බලපෑම

**මෙම ආකෘතියේ විශේෂ ලක්ෂණ.**
රේඛීය සන්නිවේදන ආකෘතියකි.
ප්‍රතිපෝෂණය සහ බාධක පිළිබඳව සඳහන් නොවේ.
සන්නිවේදන ක්‍රියාවලියේ දී සිදුවන බලපෑම පිළිබඳව වැඩි අවධායක් යොමු කොට තිබේ.

## 03 ශැනොන් හා වීවර් ආකෘතිය

ඇමෙරිකානු ජාතික ගණිතඥයින් දෙදෙනෙකු වන ක්ලෝඩ් ශැනොන් ( 1916 *2001) සහ වොරන් වීවර් ( 1894 *1978) යන දෙදෙනා විසින් 1949 දී මෙම ආකෘතිය ඉදිරිපත් කර ඇත.

The Shannon-Weaver Mathematical Model, 1949




මෙය ගණිතමය ආකෘතියකි.
සන්නිවේදනයේ තාක්ෂණික ක්‍රියාවලිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කර තිබේ.
මිනිසා හා යන්ත්‍ර සූත්‍ර මගින් සන්නිවේදන ක්‍රියාවලියට සිදු වන බලපෑම විස්තර කර ඇත.

**මෙම ආකෘතියේ සුවිශේෂි ලක්ෂණ**
රේඛීය ආකෘතියකි.
සන්නිවේදනයට බලපාන බාධක තත්ත්වයන් පිළිබඳව මුල් වරට කරුණු ඉදිරිත් කර තිබේ.
ප්‍රතිපෝෂණය පිළිබඳව අවධානය යොමු නොකරයි.
සම්ප්‍රේෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය විග්‍රහ කර ඇත.
තාක්ෂණික දෘෂ්ටිකෝණයකින් සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කර ඇත.



## 04. මහජන සන්නිවේදනය

**ජන සමූහයක් වෙත සිදු කරන සන්නිවේදනය මහජන සන්නිවේදනය නම් වේ.**
උදා: ප්‍රසිද්ධ රැස්වීම්, විශාල පිරිසක් සහභාගී වන දේශන, මැතිවරණ රැලි, දැවැන්ත සංගීත සංදර්ශන, විවිධ සැමරුම් උත්සව.

මෙහිදී විශාල ජනතාවක් වෙත සන්නිවේදනය සිදු කරයි මහජන සන්නිවේදනයේ දී සන්නිවේදකයා සහ ග්‍රාහකයා දෘශ්‍යමාන වුවත් හඩශ්‍රවණය කිරීමට හැකි වුවත් සමීප කාර්යයක් සිදු නොවේ.

බොහෝවිට තාක්ෂණික මෙවලම් භාවිතා කරයි.
මෙම සන්නිවේදනය බොහෝ විට ක්‍රීඩාංගන වල ක්‍රියාත්මක වේ

**මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන**
■ කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොලඹවා ගැනීමට හැකිවීම
■ ප්‍රස්තුත කරුණු පිළිඳව වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදාගත හැකිවීම
■ ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උපකාරීවීම
■ කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතුවීම
■ විවිධ පාර්ශ්වවල අවධානය දිනා ගැනීමට හැකිවීම

## 04. ජන සන්නිවේදනය


**එකිනෙකා නොහඳුනන විශාල ජන පිරිසකට ජන මාධ්‍ය හරහා එකවර සන්දේශයක් ලබාදීමේ ක්‍රියාවලිය ජන සන්නිවේදනයයි.**

වෘත්තීය සන්නිවේදකයන් යාන්ත්‍රික මාධ්‍ය වහල් කොට ගෙන පුළුල් ලෙසත් ක්ෂණිකවත් අඛණ්ඩවත් විශාල වූත් විවිධ වූත් ග්‍රාහක ක්ෂේත්‍රයක් වෙත සන්දේශය පතුරුවමින් යම් බලපෑමක් ඇති කිරීමේ ක්‍රියාවලියයි.

ජන සන්නිවේදනය සඳහා භාවිතා කරන ජනමාධ්‍ය කොටස් වලට බෙදිය හැකියි.

ජන සන්නිවේදනයේ ලක්ෂණ
■ අතිවිශාල පිරිසක් ඉලක්ක කර ගෙන තොරතුරු ලබා දෙයි
■ සන්දේශය පොදු වුවකි
■ අන්තර්ගතය සැමට විවෘත වේ
■ ග්‍රාහකයන් විෂම ජාතීය වේ
■ සංකීර්ණ විධිමත් ආයතනික රටාවක් පවතී

ජන සන්නිවේදන ක්‍රියාවලිය විස්තර කරන **HUB** ආකෘතිය




ජන සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳව ඉදිරිපත් කර ඇති ආකෘතිය රේ. එල්ඩන් හයිබර්ට්, ඩොනල්ඩ් ආර්. අන්ගුරේට්, තෝමස් ඩබ්ලිව්. බෝන් විසින් ඉදිරිපත් කර ඇත

**ආකෘතියේ කොටස්**

සන්නිවේදකයෝ
කේත
දොරටුපාලකයෝ
ජනමාධ්‍ය
නියාමකයෝ
පෙරහනු
ග්‍රාහක ක්ෂේත්‍ර
බලපෑම
ප්‍රතිපෝෂණ
මාධ්‍ය විකෘතිය සහ ඝෝෂාව
මාධ්‍ය විස්තාරය

**සන්නිවේදකයා**

සන්නිවේදන ක්‍රියාවක නිරතවන පුද්ගලයන්.
උදා: ජනමාධ්‍යකරුවන්, ජනමාධ්‍ය ආයතන, වෘත්තීය නිවේදකයන්,වාර්තාකරුවන්,නිෂ්පාදකවරුන්, ලේඛකයන්, වැඩසටහන් සම්පාදකවරුන්

**සංකේත**

සන්නිවේදනය සඳහා යොදාගනු ලබන සංකේත පද්ධතියකි.
උදා: සංඥා, සංකේත, අක්ෂර ඡායාරූප

**දොරටු පාලකයෝ**

කුමක් සන්නිවේදනය කරන්නේද, යන්නත් එය සන්නිවේදනය කරන්නේ කෙසේද, යන්නත් පිළිබඳව තීරණ ගන්නා පුද්ගලයන්.
උදා: සංස්කාරකවරු, ජනමාධ්‍ය ආයතන වල හිමිකරුවන්



**රේඛීය ආකෘති**

එක් පාර්ශ්වයක සිට අනෙක් පාර්ශ්වයට පමණක් තොරතුරු ගලායාම පෙන්වයි.


**රේඛීය නොවන ආකෘති**

සන්නිවේදන ක්‍රියාවලිය ද්වි පාර්ශ්විකව චක්‍රාකාර මෙන්ම විවිධාකාර ස්වරූපයන්ට විහිදී ගලායන ආකාරය විග්‍රහ කරයි.

**ප්‍රධාන ආකෘති වර්ග හතරකි.**
**ඇරිස්ටෝටල් ආකෘතිය..**
**හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය.**
**ශැනොන් හා වීවර් ආකෘතිය.**
**ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය.**

## 01 ඇරිස්ටෝටල් ආකෘතිය

ග්‍රීසියේ ප්‍රකට දාර්ශනිකයකු වූ ඇරිස්ටෝටල් පඬිවරයා (ක්‍රිපූ 348 *322) රචනා කරන ලද වාග් අලංකරණ ශාස්ත්‍රයට අයත් රිටොරික් නම් ග්‍රන්ථයේ මේ සම්බන්ධ කරුණු සඳහන් වේ.




**කථාව**: කථිකයා ඉදිරිපත් කරන තොරතුරු
**ශ්‍රාවකයෝ**: කථාව හෝ දේශනය අසා සිටින්නන්
**අවස්ථාව**: සන්දේශය ලබා දීමට හේතුවන තත්ත්වය
**බලපෑම**: ශ්‍රාවකයෝ යම් දහසක් වෙත පොළඹවා ගැනීම

මෙම ආකෘතියේ ලක්ෂණ මූලික අංග පහක් පිළිබඳව අවධානය යොමු කර ඇත.
**ඒකමාර්ගික ආකෘතියකි.**
**ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණය පිළිබඳව සඳහන් නොවේ.**
**සමකාලීන සන්නිවේදන කාර්ය පිළිබඳව පමණක් අවධානය යොමු කර ඇත.**
**නූතන සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලිය විවරණය නොකරයි.**

**08 විධිමත් සන්නිවේදනය**

**සන්නිවේදකයා පැහැදිලිව හඳුනාගත හැකියි.**
**සෑම විටම නිල වශයෙන් ඉදිරිපත් වන කිසියම් වගකීමක් සහිත ලේඛනයක් හෝ ප්‍රවෘත්තියකි.**
**සන්නිවේදකයා පැහැදිලිවම හඳුනාගත හැකිය.**
**නිල ස්වභාවයක් ගණු ලබයි.**

ජනාධිපතිතුමාගේ අගමැතිතුමාගේ කැබිනට් අමාත්‍ය-වරුන්ගේ රාජ්‍ය නිලධාරින්ගේ විශේෂ ප්‍රකාශ.
නිලවාර්තා
සිහිකැඳවීම් ලිපි
ගැසට් නිවේදන
දෙපාර්තමේන්තු වල වාර්ෂික වාර්තා
චක්‍රලේඛ

**09 අවිධිමත් සන්නිවේදනය.**

**කිසිදු නිල ස්වභාවයක් නොමැති මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි සන්නිවේදන අවස්ථා.**
උදා:කටකථා, ඕපාදූප, කැලෑ පත්තර, පෙත්සම්

විධිමත් සන්නිවේදනයට වඩා වේගයෙන් පැතිරේ.

## සන්නිවේදන ආකෘති

**සන්නිවේදන ක්‍රියාවලිය තුළ අන්තර්ගත මූලිකාංග ක්‍රියාත්මක වන ආකාරය සංෂිප්තව රූපාකාරව ආකෘති මගින් විග්‍රහ කරයි.**

**සන්නිවේදන ආකෘති මගින් සිදුවන කාර්යයන්.**
සන්නිවේදන ක්‍රියාවලියේ විද්‍යාමාන වචන දේ සාරාංශ කර දක්වයි.
තොරතුරු ගලායාම පෙන්වයි.
සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ ස්වරූපය දක්ෂතා හා ප්‍රබලතා පෙන්වයි.
මාධ්‍ය ක්‍රියාවලිය සිදුවන ආකාරය පෙන්වයි.
සන්නිවේදනයේ ස්වභාවය අවශ්‍යතාව අවස්ථාව හඳුනා ගැනීම යන කරුණු සිදුවේ.
.
**සන්නිවේදනය හා සම්බන්ධ මූලික අංග ලක්ෂණ කිහිපය-ක් සන්නිවේදන ආකෘතියක් මගින් ඉදිරිපත් කරණු ලැබේ සන්නිවේදනයෙහි සැබෑ ස්වරූපය වටහා ගැනීමට උපකාරීවන ලක්ෂණ කිහිපයක් තෝරා ඒවා අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය මතු කොට දැක්වීම සන්නිවේදන ආකෘතියකින් ඉටුවන කාර්යයකි.**
මහාචාර්ය විමල් දිසානායක

**සන්නිවේදන ආකෘති වර්ග දෙකකි.**
රේඛීය ආකෘති
රේඛීය නොවන ආකෘති



**ජනමාධ්‍ය**
ජනමාධ්‍ය යනු සන්දේශයක් යවනු ලබන හුදු යාන්ත්‍රික ක්‍රියාවලියක් නොවේ. ජනතාව එයින් බලාපොරොත්තු වන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිර්මාණය වූ සමාජ ආයතනයන්ය.
උදා: පුවත්පත්, සඟරා, රූපවාහිනිය, ගුවන්විදුලිය

**නියාමකයෝ**
සෘජුවම මාධා ආයතන හා සම්බන්ධ නොවුවද මාධ්‍ය කටයුතු හා සම්බන්ධ වූ ඒවා පාලනය කරන ආයතන හා පුද්ගලයෝය.
උදා: රාජ්‍ය කොමිෂන් සභා, උසාවි වෘත්තීය සංවිධාන, පරිභෝගික සංවිධාන,, බලපෑම් කණ්ඩායම්

**පෙරහනු**
ජනමාධ්‍ය සන්දේශ අවබෝධයට පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට මතක තබා ගැනීමට ග්‍රාහකයන් යොදා ගනු ලබන ඔවුන් සතු අත්දැකීම් පසුතලයයි.

**ග්‍රාහකයෝ**
විෂම ජාතීය ඉතා විශාල එකිනෙකා නොහඳුනන දුරස්ථ පිරිසකගේ එකතුවකි.
උදා: පාඨකයින්, ශ්‍රාවකයින්, ප්‍රේක්ෂකයින්

**බලපෑම**
බලපෑම ආකාර දෙකකට සිදුවේ.

පුද්ගලයා කෙරෙහි
සමාජය කෙරෙහි

**ප්‍රතිපෝෂණය**
එසැනින් ලැබෙන ප්‍රතිචාරය තරමක් පසුවී ලැබෙන ප්‍රතිචාර හෝ ග්‍රාහක කණ්ඩායම් වලින් ලැබෙන ප්‍රතිචාර හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රකාශයට පත්වීමයි.

**මාධ්‍ය විකෘතිය හා ඝෝෂාව**
ජනමාධ්‍ය තුළ තාක්ෂණය භාවිත වීම හේතුවෙන් මෙන්ම සන්නිවේදක ග්‍රාහක දුරස්ථභාවය හේතුවෙන් සන්දේශ විකෘති විම සහ විවිධ බාධාවන්ට ලක්විමයි. ජනමාධ්‍ය-න්ගේ ස්වභාවය අනුව බාධක තත්ත්වයන් විවිධාකාර වේ.

**මාධ්‍ය විස්තාරණය**
කිසියම් කරුණක් සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් මධ්‍යගත කිරීමයි.

**ජන සන්නිවේදනයේ ප්‍රයෝජන**
1.**ප්‍රජානනය**
දැනුම හා ඥානය ලබා ගැනීම.
2.**අපසරණය**
විකල්ප වෙත යොමුකරවීම හැරවීම.
3.**සමාජ උපයෝගීතාව**
සමාජීය පුද්ගල අවශ්‍යතා ඉටුකරදීම.
4.**ආපසු ගැනීම් කිරීම**
අවශ්‍ය අවස්ථාවක නැවැත ප්‍රයෝජනයට ගැනීම.

**අතථ්‍ය සන්නිවේදනය**
නව තොරතුරු තාක්ෂණයන්ගේ මැදිහත්වීම හේතුවෙන් චේතාන්විතව හෝ අචේතනිකව හෝ අන්තර්ගතයන් අභිප්‍රායන් ක්‍රියාකාරීන් විද්‍යාමාන වීමට විපරිත වීමට ආදේශනය වීමට හෝ නිර්මාණය වීමට අවකාශ සලසන තොරතුරු සන්නිවේදනයන් සහ ක්‍රියාකාරකම් වේ.
***උමෙයා විශ්වවිද්‍යාලය**

මෙහි **ප්‍රධාන සංරචකය වන්නේ අන්තර්ජාලයයි විද්‍යුත් තැපෑල වීඩියෝ සම්මන්ත්‍රණ සමාජජාල වෙබ් අඩවි මාර්ගගත කථාබහ ජංගම දුරකථනය ඔස්සේ ලබා දෙන සන්දේශ** අතථ්‍ය සන්නිවේදනයට අයත් වේ.

**අතථ්‍ය සන්නිවේදනයේ විශේෂතා**
01.කාර්යක්ෂමව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
02. අඩු පිරිවැය.
03. ආරක්ෂිත බව.
04. ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
05. එකවර පුද්ගලයන් රැසක් සමග සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
06. භෞතික වශයෙන් ඉඩකට අවශ්‍ය නොවීම.

**අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන**
01. අධ්‍යාපන කාර්ය සඳහා.
02. සම්බන්ධතා ගොඩනගා ගැනීමට.
03. ව්‍යාපාරික කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට.
04. ප්‍රදාරණ කටයුතු සඳහා.
05. නිර්මාණාත්මක කාර්ය සඳහා චින්තනය පුබුදුවා ලීමට.

**අතථ්‍ය සන්නිවේදනයේ අවාසි**
01. සංස්කෘතික ගැටුම් ඇතිවීම.
02. පාලනය අවමවීම.
03. නුසුදුසු පුද්ගලයන් ඇසුරට වැටීම.
04. ව්‍යාජ සම්බන්ධතා ගොඩනැගීම.
05. සමීපව නිරීක්ෂණය කිරීමේ හැකියාව අඩුවීම.

# සන්නිවේදන ස්වරූප

01.වාචික සන්නිවේදනය
02. නිර්වාචික සන්නිවේදනය
03. කථන සන්නිවේදනය
04. රූපණය
05. ලිඛිත සන්නිවේදනය
06. ශ්‍රව්‍ය සන්නිවේදනය
07. දෘශ්‍ය සන්නිවේදනය
08. විධිමත් සන්නිවේදනය
09. අවිධිමත් සන්නිවේදනය



**05 ලිඛිත සන්නිවේදනය**
**භාෂාව හා සංකේත මගින් තොරතුරු ඉදිරිපත් කිරීම ලිඛිත සන්නිවේදනය වේ**
උදා: පොත්, පත්‍ර, සගරා, පොස්ටර්, අත්පත්‍රිකා, නව කථා, කෙටිකථා, විමර්ශන කෘති, පර්යේෂණ ග්‍රන්ථ, දිනපොත්, චාරිකා සටහන්, කවි කොළ, අධ්‍යාපනික පතපොත, ඉල්ලුම් පත්‍ර **ලිඛිත සන්නිවේදනයට නිදසුන් ලෙස දැක්විය හැකිය**

ලිඛිත සන්නිවේදනය සඳහා සාක්ෂරතාව අවශ්‍ය වේ.. කථන සන්නිවේදනයට සංපේක්ෂව වඩාත් සංවිධානත්මකව ගොඩනැගිය හැකිය.අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩාකර තැබිය හැකිය.
අධ්‍යාපන කාර්යය නිර්මාණාත්මක ලේඛන කාර්යය ආයතනික පරිපාලනමය කටයුතු
හා නිතිමය කාර්යයන් සඳහා අවශ්‍ය වේ.
නිවැරදි ලෙස ලේඛනය සිදු නොවුවහොත් වැරදි අවබෝධය ඇතිවීමේ අවධානම පවති.

**ලිඛිත සන්නිවේදන කුසලතා වර්ධනයට හේතු වන කරුණු**.
ලිවීමේ කුසලතා හඳුනා ගැනීම.
සාක්ෂරතා හැකියාව.
පොතපත කියවීම.
නිරවුල්ව පැහැදිලිව සංවිධානාත්මකව ලිපි ලේඛන ලිවීම.
නිර්මාණශීලී භාවය වර්ධනය කර ගැනීම.

**06 ශ්‍රව්‍ය සන්නිවේදනය**
**සවන්දීම පදනම් කරගත් ශබ්ද මාධ්‍යයේ ඕනෑම වර්ගයක සම්ප්‍රේෂණ ස්වරූපයක් ශ්‍රව්‍ය සන්නිවේදනය නම් වේ**
උදා: ස්වභාවික ශබ්ද, කෘතිම ශබ්ද, සංගීත, නිහඬබව, සාකච්ඡා, කවිගායනා, දේශන

**ශ්‍රව්‍ය සන්නිවේදන නිපුණතා වර්ධනයට ඉවහල්වන කරුණු**

මැනවින් සවන්දීම.
විවිධ හඬවල් වෙන්කර හඳුනා ගැනීම.
ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යයනය කිරීම.
විවිධ ශබ්ද භාවිත කරමින් නිර්මාණ කිරීම.

**07 දෘශ්‍ය සන්නිවේදනය**
ඇස උපයෝගී කර ගෙන දැකීමෙන් හා බැලීමෙන් අදහස් තොරතුරු එක් රැස් කර ගන්නේ නම් එම සන්නිවේදනය දෘශ්‍ය සන්න්නිවේදනය නම් වේ.
උදා: රූපසටහන් පොස්ටර් මාර්ග සංඥා ඡායාරූප මූර්ති චිත්‍ර චිත්‍රපට

**දෘශ්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු**
රූප මැනවින් දැකීම.
රූප හඳුනා ගැනීම.
අධ්‍යාපනික කාර්යය සඳහා රූප භාවිතයට ගැනීම.
දෘශ්‍ය සන්නිවේදන අංග යොදා ගනිමින් නිර්මාණ කිරීම.

**03 කථන සන්නිවේදනය**
**මුවින් පිටවන වචන ශබ්ද අනුසාරයෙන් විවිධ අර්ථ ජනනය කිරීමයි.**
උදා: කථා කිරීම සංවාද පැවැත්වීම.
දේශනා පැවැත්වීම. ගයනා කිරීම නිවේදනය කිරීම.

**කථන සන්නිවේදනයේ කුසලතා**
කථනය නිරායාසයෙන් සිදුවේ.
කථනය ස්වභාවිකව සිදුවේ.
අන් අයට පහසුවෙන් අවබෝධ කරගත හැකිය.
ග්‍රාහකයා අනුව වචන තෝරාගත හැකිය.
නිර්වාචික සන්නිවේදනයේ උදව් ලබා ගත හැකිය.
සන්නිවේදකයා ඉදිරිපත් කරන්නා සෑම විටම ශාරීරිකව පෙනී සිටියි.

**කථන සන්නිවේදන කුසලතා වර්ධනයට ඉවහල්වන කරුණු**
සවන්දීම
කියවීම
දක්ෂ කථිකයන්ගේ කථා අනුකරණය කිරීම.
කථන පුහුණුව.
තනි පුද්ගලයකුට ඇමැතීම.
සමූහයක් ඇමතීම.
හඬ නගා උච්චරණය කිරීම.
විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම.

**04 රූපණය**
**ක්‍රියාකාරකක් වශයෙන් හෝ වෘත්තියක් වශයෙන් යම් රංගනයක යෙදීම මගින් සිදු කරන සන්නිවේදනය.**

රූපණය යන්නහි අර්ථය - දැක්වීම, විස්තර කිරීම, චරිතාදිය නිරූපණය කිරීම, මවාපෙන්වීම, ලෙස මහා සිංහල ශබ්ද කෝෂයෙහි සඳහන් කරයි.

උදා: පෙරහැරක බෙරකරුවන්,
නැටුම් ශිල්පීන්, ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකාවක නිවේදකයන්, චිත්‍රපටවල රංගන ශිල්පීන්.

**රූපණ කුසලතා වර්ධනයට හේතුවන කරුණු**
රූපණ අවස්ථා නිරීක්ෂණ.
අනුකරණය
විවිධ අවස්ථා අනුව රූපණය වෙනස්වන ආකාරය අවබෝධ කර ගැනීම.
විවිධ සන්නිවේදන අවස්ථා රූපණයෙන් ඉදිරිපත් කිරීම.



**01 වාචික සන්නිවේදනය**
කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා සහ වචන රටා භාවිතා කරමින් සිදු කරන සන්නිවේදනය.
උදා:
**කාන්ති පාසල් සාහිත්‍ය සමිතියට ගීතයක් ගායනා කිරීම.**
**පාසලේ චිත්‍ර ගුරුවරයා චිත්‍රයක් අඳින ආකාරය පිළිබඳව සිසුන්ට පාඩමක් කියාදීම.**
**පාසලේ විද්‍යා ගුරුවරයා සිසුන්ට සටහනක් ලබා දෙමින් පාඩම පැහැදිලි කිරීම.**

**වාචික සන්නිදෙනයේ කාර්යයන්**
ඉගැන්වීම උපදෙස් දීම හා මග පෙන්වීම.
පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුව.
මානව සම්බන්ධතා පවත්වා ගැනීම.
සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශයට පත් කිරීම.
පුද්ගල පෞරුෂය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටු කිරීම.

**වාචික සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට ඉවහල් වචන සාධක**
වාග් කෝෂය පුළුල් කර ගැනීම.
තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම
වර්ධනය කර ගැනීම.
පෙර සූදානම.
ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගැනීම
යෝග්‍ය භාෂාවක් භාවිතය.
පෞද්ගලික අනන්‍යතාවයක් හා ස්වයත්වයක් ගොඩනගා ගැනීම.
වගකීමන් යුතුව වචන භාවිතය.

**02 නිර්වචාචික සන්නිවේදනය**
**ලිඛිත හෝ කථන වචන භාවිතයෙන් තොරව එක් පුද්ගලයක් විසින් තවත් පුද්ගලයෙක් වෙත තොරතුරු ඉදිරිපත් කිරීම නිර්වාචික සන්නිවේදනයයි.**
නිර්වාචික සන්නිවේදනය කොටස් දෙකකි.

**සංඥා භාෂාව**
**සිරුරු බස**

**සංඥා භාෂාව අයත්වන දෑ**
සංකේත, සංඛ්‍යා, පින්තූර, රූපසටහන්, චිත්‍ර පෝස්ටර්, කාටූන්, සිතියම්

**සිරුරු භාෂාවට අයත්වන දෑ**
**මුහුණේ ඉරියව් භාව ප්‍රකාශන අභිනයන් නර්තන ඉඟිබිඟි මුද්‍රා.**
උදා:
ප්‍රසිද්ධ ස්ථානවල දුම්බීම තහනම් යනුවෙන් දක්වා ඇති සලකුණු.
පාසල් උසාවි අසල රථවාහන නලා ශබ්ද නොකිරීම පිණිස යොදා ඇති සලකුණු.
මහාමාර්ග අසල ආලෝක සංඥා වලින් මාර්ග සලකුණු දැක්වීම.
වෙළඳ සංකීර්ණ වල වැසිකිළි වල පිරිමි ගැහැණු රූප මගින් දක්වන සලකුණු.